# විසුරුවා හැරීමෙන් ආර්ථික ප්‍රශ්න විසඳේද?



**ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පසුගිය 9වැනි සිකුරාදා රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. 2015 ජනවාරි 8දා ජනාධිපති ධුරයට පත් වූ සිරිසේන මහතා 2015 අගෝස්තු මස 17වැනිදා පැවැති මහ මැතිවරණයේ ප්‍රතිඵල මත බලයටපත් යහ පාලන ආණ්ඩුවේ අගමැති ධුරයට රනිල් වික්‍රමසිංහ මහතා පත් කරන ලදී. එසේ පත්කර වූ අගමැති එම ජනාධිපති සමග වසර 3ක් ආණ්ඩු කළ පසු හිටි හැටියේම එවැනි චෝදනා ඉදිරිපත් කරමින් ඔක්තෝබර් 26වැනිදා පස්වරුවේ සෑම කෙනෙකුම පුදුමයට පත් කරමින් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අගමැති ධුරයට පත් කොට රනිල් මහතාව අගමැති ධුරයෙන් ඉවත් කළේය. එතැන් පටන් මේ ලිපිය ලියන මොහොත දක්වා මුළු රටම දේශපාලන වශයෙන් ව්‍යාකූලත්වයට පත්විය.**

නව අගමැතිවරයා පත්කිරීමේ නීත්‍යානුකූල බව සම්බන්ධව ප්‍රසිද්ධ නීතිඥ මහතුන් පවා දෙපිලකට බෙදී කෙස් පැලෙන තර්ක විතර්ක ඉදිරිපත් කළේය. නව අගමැතිවරයා පත්කළ පසු වහාම පාර්ලිමේන්තුව කැඳවා පාර්ලිමේන්තුවේ වැඩි දෙනාගේ කැමැත්ත පරීක්ෂා කළ යුතුය කියා කථානායක ඇතුළු එජාප පාක්ෂික පක්ෂ හා ඊට සහය දක්වන පක්ෂ උද්ඝෝෂණ කරන්නට විය. එහෙත් අරලිය ගහ මන්දිරයෙන් තමන් ඉවත් නොයන බව රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය. මේ තත්ත්වය හමුවේ නොවැම්බර් මස 14වැනි දින පාර්ලිමේන්තුව කැඳවීමට දින නියම කරමින් පාර්ලිමේන්තු සැසිවාරය ද කල් දැමුවේය. ඒ අනුව නොවැම්බර් 5වැනිදා ඉදිරිපත් කිරීමට තිබූ අයවැය දෙවන වර කියැවීමද නතර විය. කොටින්ම 2019ට ඉදිරිපත් කිරීමට තිබූ අයවැයද නතර විය ඒ වන විට අයවැයට සියල්ලම සූදානම් කොට තිබුණි.

මහ බැංකුව සාම්ප්‍රදායික අයවැය කථාව ඉදිරිපත් කරන විට පාර්ලිමේන්තුවේ බෙදා හැරීමට මුද්‍රණය කළ "මෑතකාලීන ආර්ථික ප්‍රවණතා - 2018 ප්‍රධාන සිදුවීම් සහ 2019 අපේක්ෂා" වාර්තාවද මුද්‍රණය වී තිබුණි. නොවැම්බර් 14වැනිදා පාර්ලිමේන්තුව රැස්වූ විට 113 පෙන්නුම් කිරීම හැකියාව දෙපාර්ශවයටම ඇතැයි ඒ වෙන විට දෙපාර්ශවයම කරුණු ඉදිරිපත් කරමින් සිටියේය. ඒ අනුව පාර්ලිමේන්තුවේ 14දා සිදුවීමට ගිය මහා භයානක සටනක් නිමාවට පත් කරමින් කවුරුත් මවිතයට පත් කරමින් ජනාධිපති තුමා ක්ෂණිකව තවත් තීරණයක් ගත්තේය. එනම් නොවැම්බර් මස 9දා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත්, නාම යෝජනා මෙම මස 19-26 දක්වා භාරගන්නා බව හා මැතිවරණය ජනවාරි 5දා පැවැත්වෙන බව ප්‍රකාශයට පත්කිරීමත්ය.

ඒ අනුව දැන් රටම දේශපාලන වශයෙන් අවුල් ජාලයක පැටලී ඇත. මේ සියල්ලම හරහා අවසානයේ සිදුවනුයේ රටේ ආර්ථිකය දරුණු ලෙස කඩාවැටීමය. ජන ජීවිතය දරුණු ලෙස

විමසීම මෙම ලිපියේ අරමුණයි.

2015 යහ පාලන ආණ්ඩුව යටතේ ප්‍රධාන පක්ෂ දෙකක් එක්ව ''සමාජ වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමයක්'' රට තුළ ක්‍රියාත්මක කිරීමට ප්‍රතිඥා දුන්නත් ගත වූ වසර 3ක කාලය තුළ එම ආණ්ඩුව යටතේ සිදුවූ ආර්ථික කාර්ය සාධනය ගැන සතුටට පත් විය නොහැකිය.

ආණ්ඩුව පත්වී මාස කිහිපයක් ගිය විට මහ බැංකුවේ බැඳුම්කර මගඩියක් සිදුකොට ආර්ථිකයටත් මහ බැංකුවටත් කළ විනාශයේ ප්‍රතිඵල අපි තවමත් අත්විඳිමු. ඒ හරහා විදේශ ආයෝජකයින් අතර ඇති කළ අවිශ්වාසය නිසා අපට අවශ්‍ය විදේශ ආයෝජනද ආකර්ෂණය කර ගැනීම දුෂ්කර විය. රටේ සමස්ත ආර්ථික



ප්‍රවීණ ආර්ථික විශ්ලේෂක
**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

වර්ධනය 2005 - 2014 දක්වා 6%කට වැඩි මට්ටමක සිට 2015-2018 කාලය තුළ 3%කට හරියටම අඩකින් අඩුවීමක් යහ පාලනය යටතේ සිදුවිය. විරැකියාවද 4% සිට 4.5%කට වැඩි වී තිබේ. තනි මැදි ඉලක්කමකින් 2019 සිට පවත්වාගෙන ගිය උද්ධමනයද 2015 සිට ක්‍රමයෙන් 3.8%, 4.0% හා 7.7%ක් ලෙස වැඩි කරමින් සිටී.

තෙල් මිල ගණන් සඳහා මිල සූත්‍රයක් දමා මාසයෙන් මාසයට ඔරොත්තු නොදෙන විධියට තෙල් මිලක් හා ඒ හා බැඳි අනිකුත් මිල ගණන් ද වැඩි කරමින් ජනතාවගේ ජීවන බර වැඩි කරන්නට විය. බදු පනතක් සම්මත කොට VAT හා අනතුත් බදු වැඩිකොට ජීවන බර තව

වැඩිකොට, විදේශ විනිමය අනුපාතිකය ඩොලර් 1ක් රු. 131/- සිට රුපියල් 176/- දක්වාම ක්ෂය කරන්නට විය. අයවැය හිඟය 5%කට වැඩි මට්ටමකට පත්විය. රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදියෙන් 78%ක් විය. විදේශ සංචිත පිරිහෙන්නට විය.

තතු මෙසේ තිබියදී හදිසියේ සිදු කළ අගමැති වෙනස හරහා රටේ ජනතාවට යම් සහනයක් උදාකිරීමට නව අගමැති මහින්ද රාජපක්ෂ මහතාට හැකිබව එතුමා සතියක් තුළ ලබාදුන් සහන මල්ලෙන් රටට ඔප්පු කළේය. 2018 නොවැම්බර් 1දා සිට හා 2019 ජනවාරි 1දා සිට ක්‍රියාත්මක වන ආකාරයට ජනතාවට දැනෙන සහන 15ක් (තෙල් මිල ගණන් අඩුකිරීම, අත්‍යවශ්‍ය ආහාර ගණනාවක මිල ගණන් අඩුකිරීම, දේශීය ගොවීන්ට සහතික මිල ක්‍රම හඳුන්වා දීම, සමෘද්ධි ප්‍රතිලාභීන්ට දෙන ණය රු. 10000/-කින් වැඩිකිරීම, පොහොර මිල අඩුකිරීම, බදු සහන රැසක් හඳුන්වා දීම, රැඳවුම් බද්ද ඉවත්කිරීම,) ලබාදුන්නේය. ඒ හරහා 2005-2014 දක්වා රට තුළ සාමය ඇති කරමින් යුද්ධයට තිත තබමින් දැවැන්ත පොදු කාර්යය පහසුකම් ඇති කරමින් ආර්ථික වර්ධනය 6% කට වඩා වැඩිකරමින් රට තුළ මිල හා බාහිර ස්ථාවරභාව ඇතිකරමින් ජනයා තුළ ජනප්‍රිය චරිතයක් ලෙස කැපී පෙනුණු මහින්ද රාජපක්ෂ මහතා මැතිවරණයකට යෑමට පෙරම ආර්ථික සහන රැසක් ලබාදෙමින් යළි මැතිවරණයකට යෑම හරහා ජනතාවගේ ප්‍රසාදය යළි ලබාගෙන රට හැදීම යෝග්‍ය බව තේරුම් ගත් නිසා දෝ ජනාධිපති සමග එක්ව යළි මැතිවරණයක් පැවැත්වීමට එකඟ වී තිබෙන බව පෙනී යයි. නිසා සිදුවූ සියල්ලම රටට හා ජනතාවට ආර්ථික වශයෙන් හොඳ කලක් ඇති වීමේ පෙර නිමිති පහළ කොට තිබෙන බව අවසාන වශයෙන් සඳහන් කරමු.